*සැ. යු. -* මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2026 වර්ෂයට අදාළව ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,481 - 2026 මාර්තු මස 20 සිකුරාදා - 2026.03.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — | පිස්කල් විකිණීම් ... ... | 70 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... | 73 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | | |


*සැ. යු. -* (i) ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 10 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 27 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

69 - B 082774 — - (2026/03)
C 1 -

# පිස්කල් විකිණීම්

## කෑගල්ල දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
*නොහොත්* සණස සංවර්ධන බැංකුව යන නාමයෙන් ද හැඳින්වේ.
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.

*නඩු අංකය* : MB/1176/22.
*කෑගල්ල දිසා අධිකරණ*
*ඇස්කීසි අංකය* : 06/2026

*.............පැමිණිලිකරු.*

*එදිරිව*

1. රඹුක්කන, පින්නවල, අංක ඒ/84/04 හි පදිංචි, වේරගොඩ ආරච්චිලාගේ දොන් චන්දන කරුණාරත්න සහ/හෝ රඹුක්කන, පින්නවල, කිරිවන්දෙණිය, අංක ඒ/84/04

2. පොල්ගහවෙල, ගෙඩිගලේවත්ත, ක්‍රීඩාංගන පාර පදිංචි හේරත් මුදියන්සේලාගේ ශාන්ති දේවිකා කුමාරිහාමි සහ/හෝ රඹුක්කන, පින්නවල, කිරිවන්දෙණිය, අංක ඒ/84/04 සහ/හෝ රඹුක්කන, පින්නවල, අංක ඒ/84/04

*...............විත්තිකරුවන්.*

වර්ෂ 2023 ක්වූ අගෝස්තු මස 21 දින දරන කෑගල්ල දිසා අධිකරණයේ මෙම නඩුවට අදාළ තීන්දුවට අනුව ඉහත සඳහන් පැමිණිලිකරුට ඉහත සඳහන් 1, 2 විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට ඇති රු. 2,571,674.08 ක මුදල සහ එකී මුදලට වාර්ෂික පොළී අනුපාතය 15% බැගින් පොළිය ගෙවීමටත් (කලින් කලට පොලී අනුපාතයේ සිදුවන උච්චාවචනයන්ට අනුව සෑම කාර්තුවක දී ම පොලී අනුපාතය වෙනස් කිරීමට යටත්ව) අනෙකුත් වියදම් හා රු. 35,500/- ක නඩු ගාස්තු ගෙවීමටත්, නියෝගකර ඇතත්, 1, 2 විත්තිකරුවන් විසින් එම තීන්දුවට අනුව කටයුතු කර නොමැති හෙයින් අංක 21980 දරන උකස් ඔප්පුවේ සඳහන් පහත උපලේඛනයේ සඳහන් ඉඩම තහනම් කර හා අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබාගත යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටු කිරීමට පළමු සහ දෙවන විත්තිකරුවන් විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කෑගල්ල දිසා අධිකරණ නඩු අංක MB/1176/22 දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කීසිය ප්‍රකාරව, කෑගල්ල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් ඒ. ඒ. එන්. සී. අලුත්ගම වන මා විසින් වර්ෂ 2026 ක්වූ පෙබරවාරි මස 13 දින නිසිලෙස තහනම් කරන ලද පළමු සහ දෙවන විත්තිකරුවන්ට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 30 දින ප. ව. 2.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති රඹුක්කන, පින්නවල, කිරිවන්දෙණිය, අංක ඒ/84/04 යන ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත කෑගල්ල, දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළේ, මැද්දේ මැදිලිය පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව තුළ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 10 පින්නවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පින්නවල යන ගම පිහිටි මාරාවේහේන නැමැති ඉඩම සඳහා ඩී. රත්නායක බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදා ඇති අංක 819 සහ 1990.08.14 දිනැති පිඹුරේ නිරූපිත කැබලි අංක 01 දරන රූඩ් එකක් (රූ. 01) විශාල ඉඩමට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරිය ද, නැගෙනහිරට : මහඔය සිට දලුග්ගල දක්වා වූ පාර ද, දකුණට : පැල ඉනි හා කම්බි වැට ද, ඩබ්ලිව්. පී. පීරිස් සිංඤෝ හිමිකම් කියන බෝගහමූලහේන නම් ඉඩම ද, බස්නාහිරට : දෙණිය පිල්ලෑව ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම හා ඊට අයත් සියලු දේත් නැවත මැන ඩී. රත්නායක බලයලත් මිනින්දෝරු තැන විසින් සාදා ඇති අංක 819ඒ සහ 2018.09.03 දිනැති පිඹුරේ නිරූපිත කැබලි අංක 01 දරන රූඩ් එකක් (රූ. 01) විශාල ඉඩමට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරිය ද, නැගෙනහිරට : රඹුක්කන සිට කිරිවන්දෙණිය දක්වා වූ පාර ද, දකුණට : පැල ඉනි හා කම්බි වැට ද, ඩබ්ලිව්. පී. පීරිස් සිංඤෝ හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : දෙණිය පිල්ලෑව ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම හා ඊට අයත් සියලු දේ ද වේ. (පෙර ලියාපදිංචිය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 117/93 වේ.)

***දේපළට පිවිසීම*** : රඹුක්කන සිට කෑගල්ල මාර්ගයේ කි. මී. 01 ක් පමණ යන විට මාර්ගයේ වම් පසට හමුවන කිරිවන්දෙණිය පාරට හැරී කි. මී. 1.4 ක් පමණ යන විට මාර්ගයේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

ඒ. ඒ. එන්. සී. අලුත්ගම,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කෑගල්ල.

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 11 දින,
කෑගල්ල දිසා අධිකරණයේ දී ය.

03-578

---

**තිස්සමහාරාම දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
(කලින් බ්‍රිස්ටල් වීදිය යනුවෙන් හඳුන්වන ලදී.)
කොළඹ 01.

*නඩු අංකය* : 01/2012/MB
*මුදල* : රු. 5,413,652.07
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය
*ස්වභාවය* : උකස් බැඳුම්කරය

................*පැමිණිලිකරු.*

*විරුද්ධව :*

1. සුජීව පුෂ්පකුමාර සමරසිංහ
2. උදය කුමාර සමරසිංහ

*දෙදෙනාම :*

අංක 04,
"ජයබිම",
සඳගිරිගොඩ, තිස්සමහාරාමය.

..................*විත්තිකරුවන්.*

වර්ෂ 2015 ක්වූ ජුනි මස 25 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි,

ඉහත නම සඳහන් 1 හා 2 විත්තිකරුවන් විසින් ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල වන රු. 2,093,500/- ක මුදලක් ඒ මුදල මත 2012 මැයි මස 17 දින දක්වා රු. 3,320,152.07 ක පොළිය හා රු. 2,093,500/- ක් වූ එකී ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල මත 2012 මැයි මස 18 දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂයකට 28% ක වැඩිදුර පොළිය ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති මුලු ඉඩම් කැබැල්ල ද, ඒ මත පිහිටි ගොඩනැගිලි ද, එයට අයත් හෝ සම්බන්ධ සියලු අයිතිවාසිකම් ද, තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති පාරක් සඳහා වෙන් කර ඇති ඉඩම් භාවිතා කිරීමේ අයිතිවාසිකම් ද, 1 හා 2 විත්තිකරුවන් සහ උකස්කරුවන් වන සුජීව පුෂ්පකුමාර සමරසිංහ සහ උදය කුමාර සමරසිංහ නැමැති තැනැත්තන්ට එකී ඉඩම් කැබැල්ල විෂයෙහි විසින් හෝ ඒ මත වූ සියලු ඉඩකඩම් අයිතිවාසිකම් දේපළ හිමිකම් පෑම් හා ඉල්ලීම් ද සමග එකී නඩු නිමිත්ත මත හා දෙකම ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. ගාමිණී ආනන්ද විසින් ලියා අත්සන් කරන ලද අංක 1012 හා 2007 සැප්තැම්බර් මස 17 දින දරන ද්විතියික උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාරව ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා බැඳී තිබෙන බවට සහ ක්‍රියාවේ යෙදවිය හැකි බවට සහ එකී නඩු නිමිත්ත මත එකී මුදල් අයකර ගැනීම අරඹයා එකී ප්‍රාථමික හා ද්විතියික උකස් බැඳුම්කර ක්‍රියාවේ යෙදවිය හැකි බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

ඒ තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත අධිකරණය විසින් තීන්දු ප්‍රකාශිත පරිදි එකී නඩු නිමිත්ත මත අයවීමට තිබෙන ඉහත කී මුදල් පොළිය හා නඩු ගාස්තු ගෙවීම පැහැර හරිනු ලැබීමේ දී තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති එකී ඉඩමේ උකස්කරුවන් වන සුජීව පුෂ්පකුමාර සමරසිංහ සහ උදය කුමාර සමරසිංහ සතු සියලු අයිතිවාසිකම් හිමිකම් හා සම්බන්ධතා ද අධිකරණය විසින් පත් කරනු ලබන වෙන්දේසිකරුවෙකු මගින් ප්‍රමාණවත් යයි එකී වෙන්දේසිකරු සළකන යථා පරිදි දැන්වීමකින් පසුව අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

උකස් කරන ලද දේපළ පළමුව එහි තක්සේරු කරන ලද වටිනාකමේ මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසට හා ඒ වටිනාකමේ මුදලට ලංසු තබන්නන් කිසිවෙකු නොවුවහොත් අධිකාරිය නිකුත් කරන ලද අවස්ථාවේ දී ඒ තීන්දු ප්‍රකාශයේ මුදලට හා ඒ විකිණීමේ දී ද ලංසු තබන්නන් කිසිවෙකු නොවුවහොත් එවිට ඉනික්බිතිව සිටින ඉහලම ලංසු තබන්නා වෙත විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසට හා පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තෙකුට ඒ විකිණීමේ දී මෙහි වූ උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති එකී උකස් කරන ලද දේපළ සඳහා ලංසු තබා මිළදී ගැනීමට ඉඩ දෙන ලෙසට හා පැමිණිලිකරු එහි ගැණුම්කරු වී නම් පැමිණිලිකරුගේ හිමිකම් පෑම්වල පොළියේ හා නඩු ගාස්තුවල ප්‍රමාණය හිලව් කර ගැනීමට පැමිණිලිකරුට ඉඩ දෙන ලෙසට ද නියෝග කොට බලය පවරා ඇති හෙයින් ද,

ඉහත සඳහන් නඩුවේ තීන්දු ප්‍රකාශයේ මුදල් අයකර ගැනීම පිණිස මෙම නඩුවේ විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පැමිණිලිකරුට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 30 දින පෙ. ව. 10.30 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ - රණකෙළිය උතුර ග්‍රාම නිලධාරි වසමේ රණකෙළිය උතුර ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද,

උතුරින් : එම ඉඩමේ අංක 3 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හිමිකම් දක්වා සිටින සඳගිරිගොඩ කුඹුරෙන් කොටසකින්, දකුණින් : එම ඉඩමේම අංක 5 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් : පාරෙන් මායිම් වූ ද, ප්‍රමාණයෙන් පර්චස් පහලොවකින් (පර්. 15) යුක්ත වූ ද හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 21/507 හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, සඳගිරිගොඩ යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් හා එයින් බලයලත් මිනින්දෝරු ඩබ්. පී. ජී. ජයවර්ධන මහතා විසින් සකස් කරන ලද අංක 326 හා 1982.07.10 දින දරන පිඹුරේ අංක 4 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි පස, වැවිලි, ගොඩනැගිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත ඉඩම මැතක දී කරන ලද මැනීමක දී පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ, රණකැටිය උතුරු (එෆ්.වී.පී. 630) ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් : එච්. ජී. සුමනලතා විසින් හිමිකම් දන්වා සිටින එම ඉඩමේ ම අංක 03 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : කේ. කේ. සාලිය උදය කුමාර විසින් හිමිකම් දක්වා සිටින ඉඩමෙන්, දකුණින් : කේ. එල්. තිලක් විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේ ම අංක 05 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් පාරෙන් මායිම් වූ ද, ප්‍රමාණයෙන් පර්චස් පහළොවකින් (පර්. 15) යුක්ත වූ ද, හෙක්ටයාර් 0.0380 කින් බලයලත් මිනින්දෝරු ඩබ්. පී. පී. ජයවර්ධන විසින් සකස් කරන ලද අංක 376 හා 1982.07.10 දින දරන පිඹුරේ අංක 4 බිම් කැබැල්ලේ නිරූපිත සඳගිරිගොඩ කොටසක් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කැබැල්ලේ නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සකස් කරන ලද අංක 3824 හා 2007.03.17 දින දරන පිඹුරේ A බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි පස, වැවිලි, ගොඩනැගිලි, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

***ඉඩමට පිවිසීම.***- CBCL තිස්ස කිරින්ද පාර ඔස්සේ කිරින්ද දෙසට මීටර් 450 ක් ගමන් කර වමට ඇති පංසල පාරට හැරී තිස්ස "ස්තූප" දක්වා මීටර් 550 ගමන් කර දකුණට ඇති සඳගිරිගොඩ පාරට හැරී මීටර් 600 ක් පමණ ගොස් සඳගිරිසෑය පසුකර මීටර් 600 ක් ගියවිට දකුණට විෂයගත දේපළ පිහිටා ඇත.

***ගෙවීමේ ක්‍රමය.***- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් දේපළ මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක ගාස්තුවක් ද, රු. 7,500/- ඉක්මවන සෑම රුපියල් 1,000 ක් සඳහාම රු. 5/- බැගින් පිස්කල් ගාස්තු සහ විකුණුම් සඳහා වන සියලුම වියදම් ගෙවිය යුතු ය.

එස්. එච්. පී. දර්ශනී (ඒ.ඒ.එල්.),
අධිකරණ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු/ප්‍රොබෙට් නිලධාරී,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
තිස්සමහාරාමය.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 06 දින දී ය.

03-418

---

# විවිධ දැන්වීම්

**තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, ඔෆිස් ටවර්, වන් ගෝල්ෆේස්, අංක 803 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටියා වූ ATOM SPORTS (Private) Limited පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

නඩු අංකය : HC (සිවිල්) 58/2025/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ එය ප්‍රකාරව අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

ATOM SPORTS (Private) Limited
අංක 803,
ඔෆිස් ටවර්,
වන් ගෝල්ෆේස්,
කොළඹ 01.

...............*පෙත්සම්කරු.*

තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙනු ලැබූ බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම විසින් ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 01, ඔෆිස් ටවර්, වන් ගෝල්ෆේස්, අංක 803 ස්ථානයෙහි පිහිටි ATOM SPORTS (Private) Limited විසින් 2025 ක් වූ ඔක්තෝබර් මස 9 දින එකී අධිකරණයට පෙත්සමක් කරනු ලැබුණු බවත්, එකී පෙත්සම 2026ක් වූ මැයි මස 12 දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණය හිමියෙකුට, දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ,*

නීතිඥ සශීන් අර්සකුලරත්න කන්නන්ගර,
අංක 11, ශාන්ත ජෝශප් පෙදෙස,
කොළඹ 14.

***සටහන.-***

එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු මෙසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් සශීන් අර්සකුලරත්න කන්නන්ගර නීතිඥවරියට ලිඛිතව දන්වා භාර දිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් නම් සමාගමේ නම සහ ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටීනම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර **2026 ක් වූ මැයි මස 11 දිනට ප. ව. 6.00** ට පෙර භාර දිය යුතු ය. *නැතහොත්* තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම් සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතුය.

03-634

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.